# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2021 (2022)

## ප්‍රායෝගික පරීක්ෂණ

මෙම විභාගයේ පහත දැක්වෙන විෂයයන් සඳහා ලිඛිත විභාගයට පෙනී සිටි අයදුම්කරුවන්ට අදාළ ප්‍රායෝගික පරීක්ෂණ දිවයින පුරා පැවැත්වීමට කටයුතු සලසා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| විෂය අංකය | විෂයය | ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වෙන දිනය |
|---|---|---|
| 52 | නර්තනය (දේශීය) | 2022.03.29 දින සිට 2022.04.10 දින දක්වා |
| 53 | නර්තනය (භරත) | 2022.03.29 දින සිට 2022.04.10 දින දක්වා |
| 54 | පෙරදිග සංගීතය | 2022.03.29 දින සිට 2022.04.10 දින දක්වා |
| 55 | කර්ණාටක සංගීතය | 2022.03.29 දින සිට 2022.04.10 දින දක්වා |
| 56 | බටහිර සංගීතය | 2022.03.29 දින සිට 2022.04.10 දින දක්වා |

දිවයින පුරා දැනට පවත්නා COVID 19 වසංගත රෝගී තත්ත්වය මත සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් පරිදි ඉහත සඳහන් දිනවල කිසියම් සංශෝධනයක් සිදුවන්නේ නම් ඒ බව ප්‍රායෝගික පරීක්ෂණ දිනට පෙර මාධ්‍ය මගින් දැනුම් දෙනු ලැබේ. ඒ පිළිබඳව අදාළ අයදුම්කරුවන් විශේෂ අවධානයකින් සිටීම වැදගත් වේ.

**විභාග අපේක්ෂකයා ප්‍රායෝගික පරීක්ෂණය සඳහා පෙනී සිටිය යුතු ස්ථානය හා දිනය සිය ප්‍රවේශ පත්‍රයේ දක්වා ඇති අතර එය වෙනත් කිසිදු හේතුවක් මත පසුව වෙනස් කරනු නොලැබේ.**

උක්ත විෂයයන්හි පාසල් අයදුම්කරුවන්ගේ ප්‍රවේශපත් අදාළ පාසල්වල විදුහල්පතිවරුන් වෙත ද පෞද්ගලික අයදුම්කරුවන්ගේ ප්‍රවේශපත් ඔවුන් අයදුම්පතෙහි සඳහන් ලිපිනයට ද තැපැල් මගින් යවා ඇත. ඊට අමතරව විභාග දෙපාර්තමේන්තු වෙබ් අඩවිය (www.doenets.lk) මගින් ප්‍රවේශ පත්‍ර බාගත කර ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා ඇත. මෙම වර්ෂයේදී ද විභාග අපේක්ෂකයින්ගේ සෞඛ්‍යාරක්ෂාව උදෙසා 52 - නර්තනය (දේශීය) හා 53 - නර්තනය (භරත) විෂයන් සඳහා තමා භාවිත කරන බෙරය හෝ අදාළ වාද්‍ය උපකරණය සිය භාවිතය සඳහා රැගෙන ඒමට අවසර දෙනු ලැබේ.

මෙම විභාගය සම්බන්ධයෙන් යම්කිසි විමසීමක් තිබේ නම් ඒ සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පහත සඳහන් දුරකථන අංක ඔස්සේ ඇමතීම් කළ හැකි බව කරුණාවෙන් සලකන්න.

**සෘජු දුරකථන අංක** - 1911,
0112784208, 0112784537, 0112786616

**ෆැක්ස් අංකය** - 0112784422

**පොදු දුරකථන අංක** - 0112786200, 0112784201, 0112785202 } දිගුව 263, 265, 280, 282, 443

**එල්.එම්.ඩී. ධර්මසේන**
**විභාග කොමසාරිස් ජනරාල්**

**6/31/උ.පෙළ/ප්‍රා.පරී./2021**
**පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව,**
**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,**
**පැලවත්ත, බත්තරමුල්ල.**
**2022.03.25**